ආබාධිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව - 2012

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණය කළ මතය**

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට ආබාධිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.2.1 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නිවාස ආධාර ගෙවීම් ගිණුමේ ශේෂය රු.14,107,356 ක් වූවත්, මූල්‍ය ප්‍රකාශනවල රු.149,069,560 ක් ලෙස දක්වා තිබුණි.

(ආ) ආපසු එවූ අධ්‍යාපන ආධාර රු.10,950 ක් නිවාස ආධාර ආපසු එවීමක් ලෙස ගිණුම්ගත කර තිබුණු බැවින් එම ප්‍රමාණයෙන් අධ්‍යාපන ආධාර වැඩියෙන් දැක්වෙන අතර, නිවාස ආධාර අඩුවෙන් දැක්වුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රදාන රු.30,183,329 ක් වූවත් ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශනවල එය රු.28,686,999 ක් ලෙස දක්වා තිබුණි. පසුගිය වර්ෂයේ ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණු රු.1,496,330 ක් සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාරයෙන් ලැබූ ආදායමෙන් හිලව් කර තිබීම හේතුකොටගෙන සමාලෝචිත වර්ෂයේ ලැබූ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) එකතුව රු.2,280,815 ක ආධාරක උපකරණ වියදම් මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි.

(ඉ) 2006 සැප්තැම්බර් 02 දින සිට 2009 ජූලි 29 දින දක්වා කාලයට අදාළව රෝගීන් 28 දෙනෙකු වෙනුවෙන් වෛද්‍ය ආධාර වශයෙන් ජනාධිපති අරමුදලින් ලැබුණු රු.500,000 ක මුදලක් වෛද්‍ය ආධාර වියදම් ගිණුමට බැර කර තිබීම නිසා වෛද්‍ය ආධාර එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ නිවාස ආධාර ලැබීම් හා ගෙවීම් අනුව 2012 දෙසැම්බර් 31 දිනට රු.21,840,695 ක ශේෂයක් තිබිය යුතු වුවත්, මූලා ප්‍රකාශන අනුව මුදල් පොතේ පවතින ශේෂය රු.20,636,908 ක් බැවින් රු.1,203,787 ක් අඩුවෙන් දක්වා තිබුණි.

### 1.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොවීම හේතුවෙන් එවා විගණනයේදී සතුටුදායක ලෙස සත්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

| | විස්තරය | වටිනාකම රු. | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| (අ) | ආබාධිත උපකරණ | | |
| | රෝද පුටු | 190,350 | (i) අයදුම්පත් |
| | අත්වාරු | 53,280 | (ii) වෛද්‍ය වාර්තා |
| | කිහිලිකරු | 102,000 | (iii) ලබා දුන් බවට ලිඛිත සාක්ෂි |
| (ආ) | උපචිත වියදම් | 11,573,058 | ලේඛනය |
| | | 14,032,308 | මූලා ප්‍රකාශනවල සටහන් 01 |
| (ඇ) | ජ'නල් සටහන් | 9,560,338 | ජ'නල් වවුචර් |

### 1.2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, හා රෙගුලාසි ආදියට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|
| **මුදල් රෙගුලාසි** | | |
| මු.රෙ.135 | - | මුදල් පාලනය සම්බන්ධ කාර්යන්, නිලධාරීන් දෙතුන් දෙනෙකුගේ පරීක්ෂණයට භාජනය වන පරිද්දෙන් හැකි හැම අවස්ථාවකදීම බෙදා දියයුතු වූවත් පහත සඳහන් කාර්යයන් එකම නිලධාරියෙකු විසින් සිදු කර තිබුණි.<br>(i) මුදල් පොත පවත්වා ගැනීම.<br>(ii) වැය ලෙජරය.<br>(iii) බැංකු සැසඳුම් පිළියෙල කිරීම.<br>(iv) චෙක්පත් ලිවීම.<br>(v) පීඅයිවි පිළියෙල කිරීම. |
| මු.රෙ. 245 | 243,800 | වවුචර් 07 ක ගෙවීම් සහතික කර නොතිබුණි. |
| මු.රෙ. 260(1) | 651,900 | (i) ගෙවීම් කළ යුත්තේ වවුචර්වල නම් සඳහන් තැනැත්තන්ට හෝ ඔවුන්ගේ නීත්‍යානුකූල නියෝජිතයින්ට වුවද එසේ නොවන පුද්ගලයන්ට ගෙවීම් කර තිබුණි. |
| මු.රෙ. 262 | | (ii) මුදල් පොතේ සටහන් නොකර ගෙවීම් කර තිබුණි. |
| මු.රෙ.394 (ආ) 11 | | නිකුත් කරන ලද චෙක්පත්වල වලංගු කාල සීමාව දීර්ඝ කිරීමේදී හා චෙක්පත් අවලංගු කිරීමේදී මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| මු.රෙ. 396 (ඇ) | 50,000 | නිකුත් කර මාස 06 ක් ගතවී ඇති චෙක්පතක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.3,621,879 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.389,761 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සසඳන විට සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,232,118 ක වැඩිවීමක් පෙන්නුම් කෙරේ. ඉදිරිපත් කරන ලද ගිණුම අනුව සුපිරි වාසනා ආදායම, වෙනත් ආදායම් හා ආධාර, පිළිවෙලින් රු.142,708,955, රු.1,211,969 ක වැඩිවීම මෙයට හේතුවී තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂයේ සභාවේ කාර්යයන් සඳහා මුදල් යෙදවීමේ විග්‍රහය අනුව ඇස්කණ්නාඩි ලබාදීම අසාමාන්‍ය ලෙස සියයට 516 ක ප්‍රතිශතයකින් වැඩිවී තිබුණු බව නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). භාණ්ඩාගාරය අනුමත කරන ලද කාර්යයට හැර වෙනත් කාර්යයන් සඳහා රු.2,268,672 ක් සභාවේ අරමුදල් යොදවා තිබුණි.

(ආ) <u>ස්වයං රැකියා ආධාර</u>

2012 වර්ෂයේදී පුද්ගලයින් 446 ක් ස්වයං රැකියා ආධාර වශයෙන් රු.මි. 7.5 ක් ලබා දී තිබුණ ද, එයට අදාළ ප්‍රගතිය වාර්තා කර නොතිබුණි.

(ඇ) <u>ආබාධිතයින් පුනරුත්ථාපනය කිරීම සඳහා වූ සංවිධාන සඳහා ආධාර</u>

1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 20 වන වගන්තිය අනුව 2012 දෙසැම්බර් 31 දින වන විට ස්වේච්ඡා සංවිධාන 98 ක් සභාව යටතේ ලියාපදිංචි කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). ඉහත පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව ආබාධ සහිත තැනැත්තන්ගේ තත්ත්වය නංවාලීම සඳහා ආණ්ඩුව විසින් ක්‍රියාත්මක කරනු ලබන වැඩ පිළිවෙලවල් සහ යෝජනා ක්‍රම අධීක්ෂණය කිරීම, සම්බන්ධීකරණය කිරීම සහ අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම සිදු කළ යුතු වුවද එසේ කර නොතිබුණි.

(ii). ආබාධ සහිත තැනැත්තන් සඳහා ප්‍රවේශ පහසුකම් සැපයීම පිළිබඳ 2009 සැප්තැම්බර් 18 දිනැති අංක 1619/24 දරන සංශෝධිත අති විශේෂ ගැසට් නිවේදනය අනුව “පවත්නා සියලුම ගොඩනැගිලි, ප්‍රසිද්ධ ස්ථාන හා සේවාවන් සහිත ස්ථාන 2014 ඔක්තෝබර් 16 දිනට ප්‍රථම ආබාධ සහිත තැනැත්තන්ට ප්‍රවේශ වියහැකි ආකාරයට සකස් කරනු ලැබිය යුතු වුවත්, ආරම්භ කර වසර 6 කට වඩා වැඩි කාලයක් ගත වී තිබුණද දිස්ත්‍රික්ක මට්ටමින් අවශ්‍ය තොරතුරු රැස්කර ක්‍රියාත්මක කිරීමට ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කර ඒ අනුව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම අවසන් කර නොතිබුණි.

(ඉ) <u>පනතේ සඳහන් කාර්යයන් ඉටු නොකිරීම.</u>

1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ ඇතුළත් පහත සඳහන් කාර්යන් ඉටු කර නොමැති බව නිරීක්ෂණය විය.

(i) ආබාධ සහිත තැනැත්තන් සහ එවැනි තැනැත්තන්ට ලබා ගත හැකි සේවා සම්බන්ධයෙන් නිරවද්‍ය සංඛ්‍යා ලේඛන පවත්වාගෙන යාම.

(ii) ආබාධවලට ප්‍රධාන හේතු, ඒවා වැළැක්වීම හා පාලනය කිරීමේ ඵලදායි පියවර ප්‍රවර්ධනය කිරීම.

(iii) ආබාධ සහිත තැනැත්තන් සඳහා පුනරුත්ථාපන මධ්‍යස්ථාන පිහිටුවා පවත්වාගෙන යාම.

(iv) ආබාධ සහිත තැනැත්තන්ට අධ්‍යාපනික හා වෘත්තීය පුහුණුව ලබා දීම.

(v) ප්‍රකාශන පල කිරීමෙන් ඔවුන්ගේ තත්ත්වය සහ අවශ්‍යතා පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම.

3.2 **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියකින් තොරව පෞද්ගලික ආයතනයකින් රු.2,564,648 ක් වටිනා ඇස්කණ්නාඩි 22,696 ක් මිලදී ගෙන තිබුණි.

(ආ) රු.13,749,353 ක් වටිනා ඇස්කණ්නාඩි 95,392 ක් ආධාරලාභීන් භාරගත් බවට හෝ කණ්නාඩි බෙදාදීමේ විස්තර ඇතුළත් ලේඛනයේ නම් සඳහන් සියළු ආධාරලාභීන්ට ඇස්කණ්නාඩි ලබාදුන් බවට නිලධාරියෙකු විසින් සහතික කර නොතිබුණි.

3.3 **අරමුදල් ඌන උපයෝජනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයේ නිවාස ආධාර ගෙවීම සඳහා ඉල්ලුම් නොකිරීම නිසා භාණ්ඩාගාරයේ ලද රු.17,705,984 ක මුදලක් ඉතිරිව තිබුණි.

(ආ) ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් ලද රු.685,400 ක් සමාලෝචිත වර්ෂයේ කිසිදු කාර්යයක් සඳහා යොදා ගෙන නොතිබුණි.

**3.4** **කාර්ය මණ්ඩලය**

සභාවේ අනුමත කාර්ය මණ්ඩල තනතුරු පහෙන් තනතුරු තුනක් සඳහා පමණක් කාර්ය මණ්ඩලය පත්කර තිබූ අතර, අමාත්‍යාංශයේ නිලධාරීන් දහතුන් දෙනෙකු ද අනුයුක්ත කර තිබුණි. 2011 මැයි 24 දින පවත්වන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ අංක 8(iv) නියෝගය අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් කාර්ය මණ්ඩලය සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි.

**4.** **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4**.1 **අභ්‍යන්තර විගණනය**

සමාජ සේවා අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක විසින් විගණන කටයුතු සිදු කර තිබුණි.

## 4.2 අයවැය පාලනය

2012 වර්ෂයේ සංශෝධිත අයවැය ලේඛනයේ ඇස්තමේන්තුවල සඳහන් ආදායම්, වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් අතර සියයට 32 සිට සියයට 128 ක පරාසයක් තුළ විචලනයන් නිරීක්ෂණය වූ බැවින් සඵල කළමණාකරණ පාලන කාරකයක් ලෙස අයවැය ලේඛනය යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 4.3 නොවිසඳී ඇති විගණන ඡේද පිළිබඳ නිරීක්ෂණ

(අ) 2012 ඔක්තෝබර් 12 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේ නියෝග 16 ඡේදය අනුව නිවාස ආධාර සඳහා වෙනම බැංකු ගිණුමක් විවෘත කරන ලෙස නියෝග කර තිබුණද, එවැනි බැංකු ගිණුමක් විගණිත දිනය වූ 2013 මැයි 20 දින වන විටත් විවෘත කර නොතිබුණි.

(ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය අනුව 2011 මැයි 24 දින පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේ නියෝග 7 ප්‍රකාරව ජංගම ගිණුමේ ඇති අතිරික්ත මුදල් ශේෂය සත් දින තැන්පතුවල ආයෝජනය කිරීම සම්බන්ධව නියෝග කර තිබුණ අතර, එය ක්‍රියාත්මක කර ඇත්තේ 2012 ජනවාරි මාසයේදීය. ඊටපසු මාසවල අතිරික්ත මුදල් තිබුණත් කිසිදු ආයෝජනයක් කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර සභාවේ සභාපතිවරයා දැනුවත් කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ආධාර ලබාදීමේ පාලනය

(ඇ) ආයෝජනය කිරීම.

(ඉ) ගිණුම්කරණය